## සටහන: ලියාපදිංචි වීම සඳහා උපදෙස්

1. අයදුම්කරුවන් (අදාළ ව්‍යාපාර ආයතන) සතුව වලංගු ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් තිබිය යුතුය. අයදුම්කරු ඇපයෙන් සීමිත සමාගමක් නම්, සංස්ථාගත කිරීම් සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

2. අයදුම්කරුවන්ට අදාළ භාණ්ඩය/භාණ්ඩ සැපයීමෙහි ලා වර්ෂ 03 ක අවම පළපුරුද්දක් තිබිය යුතුය. ඒ සම්බන්ධ පරිලෝකිත (scanned) ලේඛන අයදුම්පත සමග උඩුගත කළ යුතුය.

3. භාණ්ඩ සැපයීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඊට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සහ අවම වශයෙන් දින 30 ක ණය කාල සීමාවක් ලබා දීමේ හැකියාව අයදුම්කරුවන් සතු විය යුතු අතර එසේ කිරීමට එකඟත්වය පළ කළ යුතුය.

4. අවශ්‍ය ලිපි ලේඛන සමග ඉදිරිපත් නොකෙරෙන අයදුම්පත් ලියාපදිංචි කිරීම සඳහා සලකා බලනු නොලැබේ.

5. ලංසු කැඳවීමක් සඳහා මිල ගනන් ඉදිරිපත් කරන ලෙස කෙරෙන දැන්වීමකට පිට පිට දෙවරකට වඩා ප්‍රතිචාර නොදක්වා සිටින හෝ මීට පෙර පිරිනමන ලද ඕනෑම ප්‍රසම්පාදනයකට අසතුටුදායක භාණ්ඩ හෝ සේවා සැපයීමක් සිදු කළ ඕනෑම සැපයුම්කරුවෙකුව සැපයුම්කරු ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.

6. ඉහත උපදෙස් අනුව ආපසු නොගෙවන තැන්පතු සඳහා වන මුළු මුදල ලියාපදිංචිය අදාළ වන කාණ්ඩ ගණන මත පදනම්ව තීරණය කරනු ලැබේ.

7. දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද VAT ලියාපදිංචියක, SSCL සහතිකයක හෝ VAT -excemption සහතිකයක සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

8. ඉන්වොයිසියෙහි VAT ගාස්තුවක් සටහන් වේ නම් ඔබේ නමට VAT ලිපි ගොනුවක් විවෘතව ඇති බවට සඳහන් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපියක් සහ මෑතදීම ලබාගත් VAT නිශ්කාශන සහතිකය ඉදිරිපත් කළ යුතුය.

9. අයදුම්කරු නිෂ්පාදනයේ නිෂ්පාදකයා හෝ ලියාපදිංචි වෙළඳ ලකුණු හිමිකරු වන අවස්ථාවකදී ප්‍රධාන හෝ අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රය උඩුගත කළ යුතුය.

10. 2023, 2024 හා 2025 යන වර්ෂවලදී සමාන සැපයුම් කාණ්ඩ යටතේ රජයේ හෝ පෞද්ගලික අංශයේ ආයතනවලට වැඩිම අයිතම ප්‍රමාණයක් සපයා ඇති අයදුම්කරුවන් එම සැපයුම්වලට අදාළ ගැනුම් ඇනවුම්/ ඉන්වොයිසිවල පිටපත් උඩුගත කළ යුතුය.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය දක්වා අදාළ අයදුම්පත්වල වෙනස්කම් (edit) කළ හැකිය.

12. අයදුම්පත ඉදිරිපත් කළ විට එහි පිටපතක් ඔබේ විද්‍යුත් තැපැල් ලිපිනයට එවනු ලැබේ. අයදුම්පත ඉදිරිපත් කළ බවට තහවුරුවක් ලෙස එය ඔබ සන්තකයෙහි තබා ගැනීම මැනවි.

**ගෙවීම් පිළිබඳ උපදෙස් සහ අදාළ කාණ්ඩ තෝරා ගැනීම**

**13.** අයදුම්කරුවන් එක් එක් කාණ්ඩය සඳහා රු. 2000/= බැගින් වූ ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවිය යුතුය.
(උදා: 1.1. යටතේ දැක්වෙන්නේ එක් කාණ්ඩයකි.)
ඔබ කාණ්ඩ තුනක් තෝරා ගන්නේ නම් රු. 6000/= ක ගාස්තුවක් ගෙවිය යුතුය.

**වැඩිපුර කරන ගෙවීම් ආපසු ගෙවනු නොලැබේ:** ඔබ ගෙවිය යුතු ප්‍රමාණයට වඩා මුදල් ගෙවුවහොත් ( උදා: කාණ්ඩ දෙකක් සඳහා රු. 6000/= ක ගාස්තුවක් ගෙවී නම්) වැඩිපුර ගෙවූ මුදල ආපසු ගෙවනු නොලැබේ. කෙසේ වෙතත් ඔබට ඍජුවම සැපයුම් අංශය ඇමතීම මගින් තවත් අමතර කාණ්ඩයක් තෝරා ගත හැකිය.

**අසම්පූර්ණ ගෙවීම් ඔබගේ අයදුම්පතට අහිතකර ලෙස බලපෑ හැකිය**: සිදු කර ඇති ගෙවීම තෝරා ගත් කාණ්ඩ ගණනට සමාන නොවේ නම්, ගෙවා ඇති මුදල් ප්‍රමාණය මත ඔබ විසින් දක්වා ඇති කාණ්ඩ අතරින් මුලින් සඳහන් කළ කාණ්ඩ පමණක් සලකා බැලෙනු ඇත. (උදා: ඔබ කාණ්ඩ තුනක් තෝරා ගෙන රු. 4000/= ක ගාස්තුවක් ගෙවූයේ නම් ඔබ විසින් මුලින් සඳහන් කළ කාණ්ඩ දෙක පමණක් සලකා බැලෙනු ඇත.තෙවන කාණ්ඩය නොසලකා හැරේ.)

ප්‍රමාදයන් හෝ ගැටළු ඇති වීම වලක්වා ගැනීම සඳහා ඔබ විසින් තෝරා ගත් කාණ්ඩ සංඛ්‍යාවට අදාළ මුදල නිසි පරිදි ගෙවන බවට කරුණාකර වගබලා ගන්න.

ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් හරහා මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ යොමු අංක **505170600013** දරන විශ්වවිද්‍යාල ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට බැර කළ යුතුය.